**2022 මාර්තු මස 22 වන දින පැවති**

**හතළිස් හත්වන මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව**

**දිනය :-2022.03.22**

**ස්ථානය :- නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාව**

**වේලාව :- පෙ.ව 10.00**

**සහභාගී වූ :-**

| | | | |
|---|---|---|---|
| **01.** | ගරු සභාපති | එස්.බී කුමාරදාස මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **02.** | ගරු මන්ත්‍රී | බී.ඒ.ජී.එම්.කේ.ජී.ජී කුමාරි මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **03.** | ගරු මන්ත්‍රී | කේ.ඒ ශාන්ත මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **04.** | ගරු මන්ත්‍රී | කේ.ඒ සංජීව මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **05.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **06.** | ගරු මන්ත්‍රී | ජේ.ඒ ජයවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **07.** | ගරු මන්ත්‍රී | එච්.ඩබ්.ජී.එන් කුමුදු වසන්ති මැතිනිය | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **08.** | ගරු මන්ත්‍රී | පී.ටී සිරිසේන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **09.** | ගරු මන්ත්‍රී | ඩී.පී බන්දුලසේන මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |
| **10.** | ගරු මන්ත්‍රී | ඩී.එම්.එන් සුභාෂිණී බංඩාර මැතිනිය | ( එ.ජා.ප) |
| **11.** | ගරු මන්ත්‍රී | ජී.ඒ නෙළුම් මැතිනිය | ( එ.ජා.ප) |
| **12.** | ගරු මන්ත්‍රී | එස්.ඒ.කේ.පී ගුණවර්ධන මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **13.** | ගරු මන්ත්‍රී | කේ. හැරිසෙන්ස් මැතිතුමා | ( ජ.වි.පෙ) |
| **14.** | ගරු මන්ත්‍රී | වයි.එම් ගාමිණී බංඩාර මැතිතුමා | (ස්වාධීන කණ්ඩායම) |

**දන්වා සහභාගී නොවූ:-**

| | | | |
|---|---|---|---|
| **15.** | ගරු උප සභාපති | එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **16.** | ගරු මන්ත්‍රී | බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **17.** | ගරු මන්ත්‍රී | පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා | ( ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ) |
| **18.** | ගරු මන්ත්‍රී | ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය | ( එ.ජා.ප) |

**නොදන්වා සහභාගී නොවූ :-**

| | | | |
|---|---|---|---|
| **19.** | ගරු මන්ත්‍රී | ආර්.එම් කුමාරසිංහ මැතිතුමා | ( එ.ජා.ප) |
| **20.** | ගරු මන්ත්‍රී | එම්.ඒ විමලසුරේන්ද්‍ර මැතිතුමා | ( එ.ජා.ප) |
| **21.** | ගරු මන්ත්‍රී | පී කරුණාරත්න මැතිතුමා | ( ශ්‍රී.ල නි.ප) |

**නිළධාරීන්:-**

**01.** ලේකම් බී.එච් ප්‍රදීප් නිශාන්ත මයා

**02.** විෂය භාර කළමණාකරන සේවා නිළධාරී කේ.ජී.ඒ සම්මානි මිය

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත සුභ උදෑසනක් ප්‍රාර්ථනය කරමින්, ඉතාම ආදරයෙන් ගෞරවයෙන් පිළිගනිමින් න්‍යායපත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී.

**අ) මහ සභා වාර්ථාව සභා සම්මත කර ගැනීම.**

**2022.02.17 වන දින මහ සභා කෙටුම්පත් වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022.02.17 දින පැවැත් වූ මහ සභා රැස්වීමේ කෙටුම්පත් වාර්තාව ප්‍රාදේශීය සභා රීතීන්ට අනුව ඔබ වෙත ලැබීමට සළස්වා ඇති බැවින් එම වාර්ථාවේ අඩුපාඩු ඇත්නම් සංශෝධනයන්ට යටත්ව සහා සම්මත කර ගන්නා ලෙස ප්‍රකාශ කරමින් 2022.02.17 මහ සභා කෙටුම්පත් රැස්වීම් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

සංශෝධන

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ප්‍රාදේශීය සභාව ලේකම් පාලන කාලයේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කරන අවස්ථාවේදී එය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදි කිරීමට අවශ්‍ය වූවත් කුඩා නෙළුබෑව ක්‍රිඩා පිටිය දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩමේ තිබුණු බවත්, අක්කර 03 ක පමණ පවතින පොදු ක්‍රීඩා පිටිය පසෙක පෙර පාසලත්, ප්‍රජා ගොඩනැගිල්ලත්, කාය වර්ධන මධ්‍යස්ථානයක් තිබියදී එදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිට්ටනිය අවසාන භූමියේ ඉදි කලානම් සියළුම රාජ්‍ය ආයතන එම භූමියේ පවත්වාගෙන යාමේ හැකියාව පැවති බවත්, ක්‍රිඩා පිටියක් මාර්ගයට ආසන්නයේ පැවතියානම් එම ක්‍රිඩා පිටියේ පවතින වටිනාකම අතිමහත් වන බවත්, කුඩා නෙළුබෑව සති පොල භූමිය මේ වන විට ඉතා වටිනාකමක් සහිත භූමියක් වන බැවින් ඒ තුල පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම අපරාධයක් බවත්, එවැනි මාර්ගයක් ආසන්නව ක්‍රිඩා පිටියක් ඉදි කිරීම කෙතරම් ප්‍රයෝජනවත් ද යන්නත්, ප්‍රකාශ කරමින් යන ප්‍රකාශය පහත පරිදී සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ඉදි කරන අවස්ථාවේදී එය ප්‍රධාන මාර්ගයට මුහුණලා ඉදි කිරීමට අවශ්‍ය වූවත් කුඩා නෙළුබෑව ක්‍රිඩා පිටිය දැනට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ පිහිටි ඉඩමේ තිබුණු බවත්, අක්කර 03 ක පමණ පවතින පොදු ක්‍රීඩා පිටිය පසෙක පෙර පාසලත්, ප්‍රජා ගොඩනැගිල්ලත්, කාය වර්ධන මධ්‍යස්ථානයක් තිබියදී එදා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිට්ටනිය අවසාන භූමියේ ඉදි කලානම් සියළුම රාජ්‍ය ආයතන එම භූමියේ පවත්වාගෙන යාමේ හැකියාව පැවති බවත්, ක්‍රිඩා පිටියක් මාර්ගයට ආසන්නයේ පැවතියානම් එම ක්‍රිඩා පිටියේ පවතින වටිනාකම අතිමහත් වන බවත්, කුඩා නෙළුබෑව සති පොල භූමිය මේ වන විට බොහෝ ආර්ථික වටිනාකමක් සහිත භූමියක් වන බැවින් ඒ තුල පෙර පාසලක් හා දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් ඉදි කිරීම අපරාධයක් බවත්, ප්‍රකාශ කරමින් යන්න සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

තවද ,
දුක් ගැනවිලි නිළධාරීන් හා ඊට අදාල කමිටු පිහිටුවීමේ දී තමන් විසින් පෞද්ගලිකව නිළධාරියෙකු පත් කල යුතු බවට සඳහන් කල අතරම ගරු සභිකවරුන් සම්බන්ධයෙන් වන හදිසි දැනුම්දීම් සඳහාද වැඩපිළිවෙලක් සකස් කල යුතු බවට සඳහන් කල බවත්, ඒ සම්බන්ධයෙන් ගන්නා ඉදිරි පියවර පිළිබඳ වාර්ථාවේ සටහනක් නොමැති බව ප්‍රකාශ කරමින් එය සංශෝධනය විය යුතු බව සඳහන් කරන ලදී.

ඒ අනුව ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ප්‍රජාව වෙනුවෙන් පත් කල දුක් ගැනවිලි කමිටුව හා ආයතනික නිළධාරීන් වෙනුවෙන් පත් කර ඇති කමිටු භාරව හා කමිටු වල ගොණු පවත්වාගෙන යාමට එක් විෂය නිළධාරීයෙකු පත් කර ඇති අතර, එම අය වෙත ගරු සභිකවරුන් සම්බන්ධ හදිසි තොරතුරු දැනුම් දීමේ කාර්යය ඉටු කිරිමට උපදෙස් ලබා දෙන බව සඳහන් කරන ලදී යන ප්‍රකාශය සභා වාර්ථාවට ඇතුලත් වී සංශෝධනය විය යුතු බව ගරු සභාපති තුමා විසින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ඉදිරිපත් වූ සංශෝධනයන්ට යටත්ව 2022.02.17 වන දින පැවති මහ සභාවේ වාර්ථාව සංශෝධන වලට යටත්ව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ඒ අනුව 2022.02.17 වන දින මහ සභා රුස්වීම් කෙටුම්පත් වාර්ථාව සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

**ආ) සභාපතිතුමන් විසින් කරනු ලබන විශේෂ නිවේදනය.**

**01. විදුලිය පිරිමැසීම සම්බන්ධයෙන් පළාත් පාලන ආයතන දැනුවත් කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> රට තුල පවත්නා විදුලි අර්බුදයට විසඳුමක් ලෙස සියළුම පළාත් පාලන ආයතන බල ප්‍රදේශ තුල ඇති වීථි ලාම්පු අනිවාර්යෙන් 2022.03.07 දින සිට 2022.03.31 දින දක්වා ප.ව 6.00 සිට පෙ.ව 6.00 දක්වා වූ කාලය තුල අක්‍රියව තබන ලෙස පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය හා පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බවට වූ ලිපිය මහ සභාවට නිවේදනය කරන ලදී.

<u>ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතු</u>මා අද වන විට රට තුල පක්ෂ භේදයකින් තොරව මෙම ගැටළු සාකච්ඡා කල යුතු වන අතර රජයේ චක්‍රලේකනයන්ට යටත්ව බල ප්‍රදේශය තුල ප්‍රමාණවත් අත්‍යාවශ්‍ය ස්ථාන වල පමණක් විථි පහන් දල්වා අනෙකුත් වීථි පහන් නිවා දැමීමේ බලය ගරු සභාපතිතුමා සතුව පවතින බවත්, වීථි ලාම්පු සවි කර ඇති කණු වල දැන්වීම් පුවරු සවි කර ඇත්නම් එහිදි වීථි ලැම්පු දැල්වීම මගින් එහි පුචාරණ කටයුතු සිදු වන හේතුවෙන් ඒවාද නිශ්පල කාර්යයක් වන බවත්, ඒ පිළිබඳව බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කරනවා සේම ගෘහස්ථව සිදු කරන විදුලි පරිභෝජනය අවම කිරීම සඳහා ඔවුන් දැනුවත් කිරීමද සිදු කල යුතු බව සඳහන් කරන ලදී.

<u>ගරු සභාපති එස්.බී කුමරදාස මැතිතුමා</u> ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සඳහන් කල පරිදී බල ප්‍රදේශයේ ජනතාව දැනුවත් කිරීම වෙනුවෙන් ප්‍රචාරක රථයක් බල ප්‍රදේශය පුරා ගමන් කරවීමට ඉඩ කඩ සලසන බව සඳහන් කරන ලදී.

**) ප්‍රාදේශීය සභාව වෙත අමතා එවන ලද සංදේශ පෙත්සම්, පැමිණිලි සහ සන්නිවේදන**

**නැත.**

**ආ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්ණ**

**නැත.**

**ඉ) යථා පරිදී කල් දී ඇති යෝජනා**

**01. 2022 පෙබරවාරි මස සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම.**

<u>ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා</u> 2022 අප්‍රේල් මසට අදාලව කාර්යය මණ්ඩලය විසින් අතිකාල ඉල්ලීම් කර ඇති අතිකාල තක්සේරු වාර්ථා සභාවට ඉදිරිපත් කරමින් අදාල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

**<u>2022 අප්‍රේල්</u>**

| | | **පැය ගණන** |
|---|---|---|
| 01. අයි.ජී.සී.එන් වීරකෝන් මිය | (කළ.සේවා නිළධාරී) | 60 |
| 02. ආර් රුක්ලන්ති මහකුඹුර මිය | (පුස්තකාලයාධිපති) | 40 |
| 03. එස්.එම් මහරගෙදර මිය | (සහකාර ගිණුම් නිළධාරී) | 40 |

| | | |
|---|---|---|
| 04. එම්.එස්.එම් ගුණවර්ධන මිය | (කළ: සේවා නිළධාරී) | 60 |
| 05. කේ.ජී.ඒ සම්මානි මිය | (කළ.සේවා නිළධාරී) | 40 |
| 06. කුමුදු වාසනා වීරසිංහ මිය | (කළ සහකාර (ආවරණ) | 40 |
| 07. ටී.එච්.ආර් තාරක මයා | (කළ සහකාර (ආවරණ) | 40 |
| 08. කේ.ජී.ඩී ගමගේ මිය | (පුස්තකාල සහායක) | 40 |
| 09. මානෙල් පුෂ්පකුමාරි මිය | (පුස්තකාල සහායක) | 40 |
| 10. ඒ.ඒ පියතිස්ස මයා | (මා.කම්කරු (මුරකරු ආවරණ) | 40 |
| 11. ටී.එච්.ඩී.ඩී පෙරේරා මයා | (මුරකරු(ආවරණ) | 40 |
| 12. එම් ආර්.පෙරේරා මයා | (මුරකරු) | 75 |
| 13. එස් අන්තෝනි මයා | (මාර්ග කම්කරු) | 40 |
| 14. සුහාෂ් ගයාෂාන් මයා | (අනියම් රියදුරු) | 40 |
| 15. බන්දුල දිසානායක | (මුරකරු ආවරණ) | 75 |
| 16. ජේ.එම්.ජේ.ආර්.කේ ජයසුන්දර මයා | (විදුලි කාර්මික) | 40 |
| 17. ඩබ් තිලකරත්න මයා | (කා.කා.සහයක) | 40 |
| 18. දීපාල් ගමගේ මයා | (සෞඛ්‍ය කම්කරු) | 40 |

ගරු මන්ත්‍රී කේ.ඒ ශාන්ත මැතිතුමා 2022 අප්‍රේල් මසට අදාල අතිකාල ඉල්ලුම් කර ඇති සේවකයින්ගේ අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපති තුමා කල යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතිකාල තක්සේරු වාර්තා අනුමත කිරීමේ යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතීද යන්න විමසූ අතර කිසිදු විරෝධතාවයක් ඉදිරිපත් නොවූ බැවින් 2022 අප්‍රේල් මස අතිකාල ඉල්ලුම්කල සේවකයින් වෙත අතිකාල තක්සේරු වාර්ථා අනුමත කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**02. සමිති ගොඩනැගිල්ල සඳහා ඇස්බැස්ටෝ ශීට් ලබා දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අතුරුවැල්ල , ගොළු මරදන්කුලම ප්‍රදේශයේ පිහිටි ජනසෙත සුභ සාධක සමිතිය මීට වසර 15 කට පෙර ආරම්භ කරන ලද සමිතියක් වූවත් ස්ථිර ගොඩනැගිල්ලක් නොමැති කම මත එක් එක් සාමාජිකයන්ගේ නිවාස තුල සමිතිය පවත්වාගෙන ගියත්, මීට වසර 04 කට පෙර සමාජික මහතුන්ගේ එකතු කර ගත් මුදලින් සාදා ගත් ගොඩනැගිල්ලේ වහලය සකස් කර ගැනීමේ හැකියාවක් මෙතෙක් හිමි නොවීම මත තව දුරටත් ස්ථිර ගොඩනැගිල්ලක් නොමැතිකමින් පීඩා විඳින බව ප්‍රකාශ කරමින් අදාල ගොඩනැගිල්ල වෙනුවෙන් ඇස්බැස්ටෝ ශීට් ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා මෙම ගැටළුව වසර ගණනාවක් පුරා තිබෙන ගැටළුවක් වන අතර තමාවද කිහිප විටකදීම මේ සම්බන්ධයෙන් දැනුවත් කිරීම් කල බව සඳහන් කරමින් ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ගෙන ආ යෝජනාව සම්බන්ධයෙන් විරුද්ධත්වයක් නොමැති වූවත්, සභාවට එන තවත් මහජන ඉල්ලීම් රාශියක් තිබියදී ශීට් ලබා දීම වෙනුවෙන් ප්‍රමුඛතාවය ලබා දිය හැකිද යන්න සලකා බැලිය යුතු බවත්, සභාවට ලැබෙන ඉල්ලීම් සම්බන්ධයෙන් ප්‍රමුඛතා ලේඛනයක් අනිවාර්යෙන්ම සකස් කල යුතු වන අතර අද රටේ පවතින තත්වය සැළකිල්ලට ගෙන සභා අරමුදලින් සිදු කරනු ලබන වියදම් පිළිබඳ දැඩි අවධානයක් ලක් කල යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ඉදිරිපත් වූ යෝජනාව සඳහා තමන් විරුද්ධ නොවන අතර එය ඉටු කර දීමට කටයුතු කරන ලෙසත්, නමුත් ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා සඳහන් කල පරිදී ප්‍රමුඛතාවය ලබා යුතු යෝජනා සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසත් තමන් මීට වසර 04 ක ට පෙර රත්මලේ හංදියේ පොදු වැසිකිළිය සඳහා ජලය ලබා දෙන ලෙස ඉල්ලීම් කල නමුත් මේ වන තෙක් ඒ පිළිබඳ කිසිදු පියවරක් ගෙන නොමැති බව සඳහන් කරන ලදී.

තවද එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී වෙන් කල මුදල ප්‍රමාණවත් නොවූ අවස්ථාද පැවතියා සේම කොන්ත්‍රාත්කරුවන් මෙහි කාර්මික නිළධාරියා සමඟ කටයුතු කිරීමට අකමැත්ත දැක්වූ අවස්ථාද පැවති බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල පොදු වැසිකිළිය සඳහා ජලය ලබා දීම සිදු කරන ලෙස ජල සම්පාදන මණ්ඩලය වෙත ඇස්තමේන්තු යොමු කර දිගින් දිගටම ඉල්ලීම් කලත් ජලය ලබා දීමේ හැකියාවක් නොමැති බවට ප්‍රකාශ කල බවත්, මීට මාස 03 කට පෙර ජලය ලබා දීමේ හැකියාව පවතින බවට මොරගොඩ ජල බලාගාරය විසින් දැන්වූ අතර මේ වන විට මුදල් ගෙවා ඇතත්, ක්‍රියාත්මක කිරීමේදී ප්‍රමාද වීමේ ගැටළු ඇති වී ඇති බව වැඩි දුරටත් කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා ඉදිරිපත් වූ යෝජනාව සම්බන්ධයෙන් අදහස් දක්වනවා වෙනුවට වෙනත් මාතෘකාවන් ඔස්සේ අදහස් දැක්වීම් සිදු නොකරන ලෙස ප්‍රකාශ කරමින් ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා ඉදිරිපත් කල ගැටළුව සැහැල්ලුවට නොගන්නා ලෙස ද සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා මහ සභාවට යෝජනාවක් ඉදිරිපත් වූ පසු එය ස්ථිර කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කලත් ක්‍රියාත්මක කල යුතු ප්‍රමුඛ කරුණු පවතින බැවින් ඉදිරිපත් වන යෝජනා අනිවාර්යෙන් ප්‍රමුඛතා ලේඛනයක සටහන් කල යුතු බව ප්‍රකාශ කරන ලදී.

තවද ගෙවතු වගා වැඩසටහන සම්බන්ධයෙන් ඉදිරිපත් වූ යෝජනාව තුල අදහස් දැක්වීමේදී සභා ගර්භයේ සිටි ඇතැමෙකු ගොවි ජන සේවා මධ්‍යස්ථානය වෙත ගොස් එහි කෘෂිකර්ම උපදේශකවරු හමුවී ජ.වි.පෙ පක්ෂය ඔවුන් විවේචනය කරන බවට ප්‍රකාශ කර තිබූ බවත්, ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා සඳහන් කල පරිදී ඉදිරිපත් වූ යෝජනාවට වඩා වැදගත් ඉල්ලීම් රැසක් පවතින බවත්, මීට ඉහතදී තමන් විසින් ශ්‍රාවස්තිපුර මාතෘ සායන මධ්‍යස්ථානය වෙත ප්ලාස්ටික් පුටු ලබා දෙන ලෙසට ඉල්ලීම් කර තිබූ නමුත් ඒ සඳහා පුටු ලබා දීම සිදු කලාද යන්න තමන් දැනුවත් වී නොමැති බවත්, මින් ඉදිරියට හෝ ඉදරිපත් වන යෝජනා ප්‍රමුඛතා ගත කිරීමක් සිදු කර අත්‍යාවශ්‍ය යෝජනා පමණක් හැකි අයුරින් ක්‍රියාත්මක කරමුයි යන්න සඳහන් කරන ලදී.

තවද තමන් විසින් අතුරු මාර්ගයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය පමණක් රැගෙන දෙන ලෙසටත් ශ්‍රමය යොදා ගෙන අදාල සංවර්ධන කටයුතු තමා විසින් සිදු කර ගන්නා බවට සඳහන් කර තිබුනත් මෙතෙක් එම මාර්ගය සංවර්ධනය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා දී නොමැති බව සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් අවශ්‍ය අමුද්‍රව්‍ය මිල දී ගැනීමට හා සැපයීමට අදාල නිලධාරීන් දැනුවත් කර තම අනුමැතිය ලබා දී තිබුනත් එය ක්‍රියාත්මක නොවීම සම්බන්ධව කණගාටු වන බව සඳහන් කරන ලදී.

## 03. පළුගස්වැව අතුරු මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස අනුමත කිරීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා නුග සෙවණ පළුගස්වැව, ගල්කුලම ලිපිනයේ පදිංචි ඩබ්.එම්.කේ.ජී රත්න උදේනි යන අය විසින් ගල්කුලම A9 මාර්ගයේ සිට මීටර් 100 ක් පමණ දුරින් පිහිටන අඩි 12 ක මාර්ගයේ සිට දකුණු දෙසට මීටර් 40 ක පමණ දුරට දිවෙන මාර්ගය හෙවත්, බලයලත් මිනින්දෝරු එම්.ඒ.ඒ මුණසිංහ යන අය විසින් අඳින ලද සැළසුම් අංක 1857 යටතේ දක්වා ඇති මාර්ගය මෙම ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙස නම් කර දෙන ලෙසට ඉල්ලීම් කර ඇති බැවින් අදාල මාර්ගය ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.එම්.කේ.ජී .ජී කුමාරිහාමී මැතිණිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් ගල්කුලම A9 මාර්ගයේ සිට මීටර් 100 ක් පමණ දුරින් පිහිටන අඩි 12 ක මාර්ගයේ සිට දකුණු දෙසට මීටර් 40 ක පමණ දුරට දිවෙන මාර්ගය හෙවත්, බලයලත් මිනින්දෝරු එම්.ඒ.ඒ මුණසිංහ යන අය විසින් අඳින ලද සැළසුම් අංක 1857 යටතේ දක්වා ඇති මාර්ගය මෙම ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙස නම් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

## 04. ගුවන් හමුදා කඳවුර අසල මාර්ගය සභාවට පවරා ගැනීම

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අංක 260/9, ගුවන් හමුදා කඳවුර අසළ, අනුරාධපුර ලිපිනයේ පදිංචි කේ.පී.සී.පී කොඩිප්පිලි යන අය විසින් 239 තම්මැන්නාව ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ බලයලත් මිනින්දෝරු පී.බී ඉලංගසිංහ යන අය විසින් මැන නීත්‍යානුකූලව වෙන් කර ඇති 2014/ඒඑන් /340 දරණ සිතියමට අදාල මෙතෙක් ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොමැති මාර්ගය, මාර්ගය භාවිතා කරන සියළු දෙනා විසින් ප්‍රාදේශීය සභාවට පවරා ගන්නා ලෙසට ඉල්ලීම් කර ඇති බව ප්‍රකාශ කරමින් අදාල මාර්ගය ප්‍රාදේශිය සභා මාර්ගයක් ලෙස අනුමත කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතිතුමා අදාල මාර්ගය මෙම ප්‍රාදේශීය සභාවට මෙන්ම ඇතැම් විට අනුරාධපුර මහ නගර සභා බල ප්‍රදේශයට අයත් විය හැකි බැවින් ඒ සම්බන්ධයෙන් නිර්වද්‍යතාවය විමසා බලන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු මන්ත්‍රී බී.ඒ.ජී.ඒම්.කේ.ජී .ජී කුමාරිහාමී මැතිණිය ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල මාර්ගයේ මිනින්දෝරු සැළසුම ඉදිරිපත් කර ඇති බවත්, එය නිවැරදිව පරීක්ෂා කල බවත්, සඳහන් කරන ලදී. අනතුරුව ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 239 තම්මැන්නාව ග්‍රාම නිළධාරී කොට්ඨාශයේ බලයලත් මිනින්දෝරු පී.බී ඉලංගසිංහ යන අය විසින් මැන නීත්‍යානුකූලව වෙන් කර ඇති 2014/ඒඑන් /340 දරණ සිතියමට අදාල මෙතෙක් ප්‍රාදේශීය සභාවට පවරා ගෙන නොමැති මාර්ගය මෙම ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් ලෙස නම් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**05.** **වාහන කුලී පදනම මත ලබා දීම සඳහා වන 2022 වර්ෂයේ මුල් භාගයේ දිස්ත්‍රික මිල කමිටු වාර්ථාව**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 2022 වර්ෂයේ මුල් භාගයේදී අනුරාධපුර දිස්ත්‍රික් මිල කමිටුව විසින් වාහන කුලී පදනම මත ලබා දීමට අදාල මිල ගණන් මහ සභාවට ඉදිරිපත් කරමින් අදාල මිල ගණන් යටතේ සභාව සතු වාහන කුලී පදනම මත ලබා දීම සුදුසු බවට යෝජනා කරන ලදී. නමුත් මේ වන විට මාසිකව රැස්වන දිස්තික් මිල කමිටුව වෙනස්වීම් වලට භාජනය වන බැවින් එම දිස්ත්‍රික් මිල කමිටුවේ නිර්දේශයන්ට අනුව වාහන කුලී පදනම මත ලබා දීම සුදුසු බව ද යෝජනා කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව කාලෝචිත බව ප්‍රකාශ කරමින් අදාල දිස්ත්‍රික් කමිටු මිල ගණන් යටතේ සභාව සතු වාහන කුලි පදනමින් ලබා දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ගෙන ආ යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් 2022 වර්ෂයේ මුල් භාගයේදී අනුරාධපුර දිස්ත්‍රික් මිල කමිටුව විසින් වාහන කුලී පදනම මත ලබා දීමට අදාල මිල ගණන් යටතේ සභාව සතු වාහන කුලී පදනම මත ලබා දීමේ යෝජනාව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**06.** **276 කීරික්කුලම බෝධිරාජ ධර්මාලංකාර විහාරය අසල රජයට අයත් භූමියෙන් අක්කර 02 ක් වෙන් කර ගැනීම**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා 276 කීරික්කුලම බෝධිරාජ ධර්මාලංකාර විහාරය අසල රජයට අයත් භූමියෙන් අක්කර 02 ක් ක්‍රීඩා පිටියක් ලෙස වෙන් කර දෙන ලෙසට කරන ලද ඉල්ලීමට අනුව නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බිම් සවිය වැඩසටහන යටතේ මැනුම් කර ඇති කැ.සි 110191 කලාප 08 හි ලොට් අංක 01 යටතේ පවතින ඉඩමේ කොටසක් වන බැවින් ඊට අදාල ඉදිරි පියවර ගැනීම සඳහා ඉල්ලුම් කරන ඉඩම් කොටසට අදාල අනුරේඛණය ඉදිරිපත් කරන ලෙස දන්වා ඇති බැවින් ඊට අදාල මිනුම් කටයුතු සභාව මැදිහත් වී සභා අරමුදලින් සිදු කිරීම සුදුසු බවට යොජනා කරන ලදී.

ගරු මන්ත්‍රී පී.ටී සිරිසේන මැතිතුමා ඉදිරිපත් කරන ලද යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් අදාල ක්‍රීඩා පිටිය වෙනුවෙන් වෙන් කරන අක්කර 02 ක භූමි ප්‍රමාණයට අදාල ඉඩම් කොටස මැනීම් කිරීමේ යෝජනාව පැමිණ සිටි සියළු ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**07.** **ගම සමඟ පිළිසඳරක් 2022 ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගම සමඟ පිළිසඳරක් 2022 ග්‍රාමීය ජීවනෝපාය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම යටතේ නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති බල ප්‍රදේශයේ ලියාපදිංචි ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

| අනු අංකය | ග්‍රාම නිළධාරි වසම | ව්‍යාපෘතියේ නම | වෙන් කල ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 260 ශ්‍රාවස්තිවත්ත | ශ්‍රාවස්තිවත්ත, පොල්වත්ත මාර්ගය සංවර්ධනය කිරීම | 388,000.00 |
| 02 | 270 තුරුවිල | ජන උදාන ගම්මානයේ ප්‍රජා ශාලාව අසල සිට තුන්මන් හන්දිය දක්වා මාර්ගය පෙට්ටි බෝක්කුවක් දැමීම | 194,000.00 |
| 03 | 267 පාවක්කුලම | පාවක්කුලම ශානක මහතාගේ කඩය අසල සිට ශාන්තිවාදී සමිති ශාලාව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 485,000.00 |
| 04 | 272 සුහදගම | සුහදගම කරුණාරත්න මහතාගේ නිවස ඉදිරිපිට සිට එල් අබේරත්න මහතාගේ නිවස දක්වා මාර්ගය බෝක්කුවක් ඉදි කිරීම | 194,000.00 |
| 05 | 272 සුහදගම | සුහදගම මහින්ද මහතාගේ නිවස අසල සිට ප්‍රදීප් කුමාර මහතාගේ නිවස දක්වා වන මාර්ගය බොරළු දමා සකස් කිරීම | 97,000.00 |
| 06 | 271 හිදෝගම | 7 ඇල හිදෝගම චන්ද්‍රා විමලරත්න මහත්මියගේ නිවස අසල ප්‍රධාන මාර්ගයේ සිට අතුරු මාර්ගය මීටර් 300 සංවර්ධනය | 291,000.00 |
| 07 | 271 හිදෝගම | හිදෝගම සොහොන් බිම අසලින් සමෘද්ධි පාරේ සිට මීටර් 200 බොරළු දමා සංවර්ධනය කිරීම | 485,000.00 |
| 08 | 262 කිඹුලාකඩ | 262 කිඹුලාකඩ ඒ.එම් කුමාරසිංහ මහතාගේ නිවස අසල සිට ඒ.එම් සෙනෙවිරත්න මහතාගේ නිවස දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය | 630,500.00 |
| 09 | 264 දිවුල් වැව | 264 දිවල්වැව උදය රංජිත් මහතාගේ නිවස අසල සිට එල්.එම් මහතාගේ නිවස දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 630,500.00 |
| 10 | 259 ශ්‍රාවස්තිපුර | ශ්‍රාවස්තිපුර සුදර්ශණමාවත 4 වන පටුමඟ අනුර මහතාගේ වෙළඳසැළ පිටුපස යෝධ ඇල දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය | 1,940,000.00 |
| | | | |

නැ.නු.ප ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය

| අනු අංකය | ග්‍රාම නිළධාරි වසම | ව්‍යාපෘතියේ නම | වෙන් කල ප්‍රතිපාදන ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | 241 තම්මැන්නාපුර | අළුත් නුවර පාර වෛද්‍යා බලකා කඳවුර අසල යුධ හමුදා නිවාඩු නිකේතනය පාර පෙට්ටි බෝක්කුවක් ඉදි කිරීම | 970,000.00 |

| | | | |
|---|---|---|---|
| 02 | 275 කවරක්කුලම | වන්නම්මඩුව අලහකෝන් මහතාගේ නිවස ඉදිරිපසින් ගම හරහා යන මාර්ගය බොරළු දමා සංවර්ධනය | 873,000.00 |
| 03 | 279 මහකලත්තෑව | මිහිඳු මාවත ගමේ පිහිටී අබලන්ව ඇති මාර්ගය පිළිසකර කිරීම | 873,000.00 |
| 04 | 235 සුචරිතගම | යහලේගම මල්වතු ඔය පාරේ කුඹුරු සඳහා ගමන් කරන අතුරු මාර්ගය බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 485,000.00 |
| 05 | 247 වන්නියම්කුලම 06 | ත්‍රිකෝණ පිටිය සංවර්ධනය කර උද්‍යානයක් බවට පත් කිරීම | 58,200.00 |
| 06 | 241 තම්මැන්නාපුර | පුබුදු මාවත ධර්මාලංකාර මාවත දක්වා ඇති අතුරු මාර්ගයෙන් පෙට්ටි බෝක්කු හා බොරළු දමා සංවර්ධනය කිරීම | 485,000.00 |
| 07 | 279 මහකලත්තෑව | ඉච්චන්කුලම වානේ කඩේ හංදිය සිට චිත්‍රාකාන්ති මියගේ නිවස දක්වා මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීම | 727,500.00 |
| 08 | 246 වන්නියම්කුලම 05 | අනුලා දේවි මාවත හරස්පාර කාණු පද්ධතිය පිළිසකර කිරීම | 485,000.00 |
| 09 | 258 පොතානේගම | පොතානේගම විජය මාවත මීටර 130 ක් පමණ කුට්ටිගල් ඇතිරීම | 1,552,000.00 |
| 10 | 258 පොතානේගම | 258 පොතානේගම යෝධ ඇල දකුණු පස ඉවුරේ පැල සිටුවීම හා අලංකාර උද්‍යානයක් ලෙස සකස් කිරීම සඳහා | 388,000.00 |
| 11 | 243 වන්නියම්කුලම 02 | 243 ශාන්තිමාවත ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරීම | 1,552,000.00 |
| 12 | 246 වන්නියම්කුලම | බණ්ඩාරණායක මාවත සිට අනුලා දේවී මාවත යා කරන 2 වන පටුමඟ මාර්ගය කොන්ක්‍රීට් කිරීම | 1,552,000.00 |
| 13 | 236 සුචරිතගම | නාච්චාදූව මාර්ගයේ සිට ශ්‍රමදාන මාවත සිට ඇල්බන්ට් එක මාර්ගය සමෘද්ධි මාවත දක්වා බොරළු දමා ප්‍රතිසංස්කරණය කිරීම | 1,552,000.00 |
| 14 | 277 කුඩා නෙළුම්කුලම | ටෙලිකොම් ටවර් ලයින් මාර්ගයේ ඉතිරි කොටසෙහි කුට්ටිගල් ඇතිරීම | 970,000.00 |
| 15 | 279 මහකලත්තෑව | අරුණගම අජිත් මහතාගේ නිවස අසල මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 194,000.00 |
| 16 | 280 තරියන්කුලම | පළුගස්වැව ඇල්බට් මහතාගේ නිවස අසල මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම | 388,000.00 |
| 17 | 275 කවරක්කුලම | 275 කවරක්කුලම දේවාල පාර කුට්ටි ගල් අතුරා මීටර් 180 ක් පමණ තුංමන් හන්දිය දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 1,552,000.00 |
| 18 | 236 සුචරිතගම | යහලේගම සමෘද්ධි මාවත හා සුචරිතගම උපුල් මහතාගේ නිවස අසල සිට ආරියරත්න මහතාගේ නිවස දක්වා මාර්ගය බොරළු දමා ප්‍රතිසංස්කරණය | 970,000.00 |
| 19 | 237 | ඉත්තෑවැව ට්‍රාන්ස්පෝමරය සිට මල්වතු ඔය දක්වා | 485,000.00 |

| | | | |
|---|---|---|---|
| | මහපාලාඩිකුලම | මාර්ගය මීටර් 500 බොරළු ඇතිරීම | |
| 20 | 237<br>මහපාලාඩිකුලම | වෙළුවනාගම පළමු වන පටුමග බොරළු දමා සකස් කිරීම | 97,000.00 |

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය එම යෝජනාව ස්ථිර කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතමා ඉදිරිපත් කල යෝජනාව සම්බන්ධයෙන් යම් විරෝධතාවයක් පවතින්නේ ද යන්න විමසූ අතර විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූ බැවින් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හා නාච්චාදූව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ක්‍රියාත්මක කිරීමට නියමිත ව්‍යාපෘති මහ සභාවට ඉදිරිපත් කරමින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති බල ප්‍රදේශයේ ස්වෙච්ඡා සංවිධාන හරහා ගිවිසුම් අත්සන් කර කොන්ත්‍රාත් පදනමින් ක්‍රියාත්මක කිරීම සුදුසු බවට වූ යෝජනා ව පැමිණ සිටි සියළු මහජන නියෝජිතයන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.

**ඊ) කාරක සභාවල වාර්තා**

- 2022 මාර්තු මස 08 වන දින මුදල් කමිටු වාර්ථාව

**සභා ගත කරන ලදී.**

**එ) ලැබීම් ගෙවීම් මාසික වාර්තා**

2022 පෙබරවාරි මස ආදායම් හා වියදම් වාර්ථා මහ සභාවේ සලකා බැලීම සිදු කරන ලදී.

**ඒ) රැස්වීම් කැඳවීමේ දැන්වීම් හා වෙනත් කාරණා ඉදිරිපත් කිරීම.**

**01. නිවාඩු දැනුම් දීම.**

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා ගරු උප සභාපති එම් සරත් ප්‍රේමචන්ද්‍ර මැතිතුමා ,ගරු මන්ත්‍රී බී.බී.ඊ ගයාන් චාමර මැතිතුමා, ගරු මන්ත්‍රී පී.එස්.බී සිරිවර්ධන මැතිතුමා , ගරු මන්ත්‍රී ආර්.එම්.අයි ජනක ශ්‍රීමාලි මැතිනිය , මහ සභාවට නොපැමිණෙන බවට දන්වා යොමු කර තිබූ නිවාඩු ඉල්ලීම් මහ සභාවට ඉදිරිපත් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු වසන්ති මැතිණිය අදාල නිවාඩු ඉල්ලුම් කර ඇති ගරු සභිකවරුන් වෙත නිවාඩු ලබා දීම සුදුසු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත ගුණවර්ධන මැතිතුමා පසු ගිය දිනවල සිට ක්‍රියත්මක අලි අහල කැපීමේ වැඩපිළිවෙල තුල පස් ප්‍රවාහනයේ යෙදෙන මාර්ග වල විශාල ගැටළුවක් පවතින බවත්, එම මාර්ග දිනෙන් දිනම අබලන් තත්වයට පත් වන බැවින් ප්‍රවාහනය කරන පස් හෝ යොදා අදාල මාර්ග පිළිසකර කරීමට කටයුතු කරන ලෙස අදාල පුද්ගලයන් දැනුවත් කරන ලෙසත් එසේ නොමැති වුවහොත් ඉදිරියේදී මේ සඳහා සභා අරමුදලින් මුදල් යෙදවීමට සිදු වනු ඇති බවත්, කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා මේ සඳහා තාක්ෂණ නිළධාරී මහතා යොමු කර අබලන් මාර්ග පිළිබඳව සොයා බලා ඒවා පිළිසකර කර ගැනීමට වැඩපිළිවෙලක් දියත් කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ආලංකුලම කාපට් මාර්ගයේ ස්ථාපිත කර ඇති පාලම මේ වන විට පුපුරා ගොස් ඇති බවත්, මෙහි බර වාහන බොහෝ ප්‍රමාණයක් ගමන් ගන්නා බැවින් මේ සඳහා විකල්ප මාර්ග යොදා ගත යුතු බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ජේ.ඒ.ඩී විමලසිරි මැතිතුමා ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා සඳහන් කල පරිදී අදාල මාර්ගයේ බර වාහන මුලින් ගමන් කලත් අප එය නැවැත්වීමට කටයුතු කල බවත්, අනතුරුව හිස් බර වාහන ගියත් ඒවාද නතර කිරීමට කටයුතු කල බවත්, මෙලෙස ඉන්ටර්ලොග් හා කාපට් මාර්ගවල මේ වන විට ධාවනය නොවන බව වගකීමෙන් යුතුව ප්‍රකාශ කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී කේ.ඒ සංජීව මැතිතුමා මේ වන විට අලි මිනිස් ගැටළුව බරපතල ලෙස පවතින සේම, මාර්ග සම්බන්ධයෙන් වන ගැටළුවද පවතින බවත්, මේ වන විට අදාල පස් ප්‍රවාහනය කරන අයවළුන් එම මාර්ග මෝටර් ග්‍රේඩර් කර දීම සඳහා එකඟතාවය පල කර ඇති බව සඳහන් කරන ලදී.

තවද අලි අඟල් මගින් ඉවත් කරන පස් යොදා ගනිමින් නුවර වැවේ කොටසක් ගොඩ කරන බවත්, ප්‍ර ධාන දේශපාලන අමාත්‍යාවරයෙකුට අයත් භූමියක්ද මේ අයුරින් ගොඩ කරන අතරම ගරු සභාපතිතුමා විසින් ඒ සඳහාද අනුමැතිය ලබා දී ඇති බවත්, එම භූමි වලට ඔප්පු පවතින්නේ ද යනනත් නුවර වැවේ වානේ උස මුහුදු මට්ටමේ සිට අඩි 88.5 ක් උසින් වන නමුත් මේ ගොඩ කිරීම දැන් සිදු වන්නේ මෙම සීමාව තුල බැවින් විශාල ගැටළු ඇති වි හැකි බවත්. මෙහි ආදර්ශයක් ගෙන තවත් පුද්ගලයන් මෙම ක්‍රියාවේ යෙදුනහොත් විශාල ප්‍රශ්ණයක් වන සේම එතුලින් ඓතිහාසික වැවක් විනාශ වීමේ අවධානමකට ලක් වන සේම මේ සම්බන්ධයෙන් දැනුවත් කර අදාල කාර්යය නතර නොකලහොත් වර්ෂාපතනය අවම කාල වලදී තවදුරටත් භූමිය ගොඩ කිරීමට කටයුතු කලහොත් විශාල විපතක අවසානයක් වන බවද කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා අදාල ඉඩමට නිවැරදි ඔප්පු පවතින බැවින් අදාල සභා අනුමැතිය ලබා දී තිබෙන බවත්, මේ සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ පනත යටතේ කරුණු විමසා තිබුණු අතර ඒ සඳහා මේ වන විට පිළිතුරුද යොමු කර ඇති බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද අදාල ඉඩම සඳහා අනුමැතිය ලබා නොදීමට හේතුවක් නොමැති වන සේම එම ඉඩම අදාල පාර්ශවය විසින් වසර 25 කටත් එහා භුක්ති විඳිමින් සිටී ඉඩම් හිමියෙකුගෙන් මිල දී ගෙන තිබූ බවත්, එම ප්‍රදේශයේ එම ඉඩම පමණක් නොව ඉඩම් රාශියක් පවතින බවත්, මෙම ගැටළුව පාර්ලිමේන්තුවේදී පවා සාකච්ඡාවට ලක් කල කරුණක් වූ නමුත් මෙම නුවර වැවේ ගැටළුව සඳහා තවමත්, විසඳුමක් හිමි වී නොමැති බවත්, මෙය ජාතික මට්ටමින් විසඳිය යුතු විනා පුද්ගල බද්ධව පෙන්වා දිය යුතු නැති බව සඳහන් කරන ල.දී

ගරු මන්ත්‍රී කුමුදු ප්‍රියන්ත මැතිතුමා ශ්‍රාවස්තිපුර උප තැපැල් කාර්යාලය සම්බන්ධයෙන් ගැටළුවක් පවතින බවත්, මෙය ආරම්භ කල දින සිටම දුම්රිය දෙපාර්තමේන්තුවට අයත්, ගොඩනැගිල්ලක පවත්වාගෙන ගොස් ඇති අතර මේ සඳහා ශ්‍රාවස්තිපුර ප්‍රාදේශීය සභාවට අයත් කඩ කාමරයක් කුලී පදනමින් ඉල්ලා සිටියත් , මෙතෙක් ඒ සඳහා පියවර ගෙන නොමැති නමුත් එම භූමිය ආසන්නයේ දුම්රිය දෙපාර්තමේන්තුවට හෝ වෙනත් ආයතනයකට අයත් නොවන පර්චස් 04 ක 05 භූමියක් පවතින බැවින් අදාල භූමියේ ගොඩනැගිල්ලක් ඉදි කර එය තැපැල් කාර්යාලය සඳහා කුලී පදනමින් ලබා දීමේ හැකියාවක් පවතින්නේ නම් එමගින් ආදායමක් ද ලබා ගත හැකි බව සඳහන් කරමින් එතෙක් සභාවට අයත් වසා දමා ඇති කඩ කාමරයක් මේ සඳහා ලබා දෙන ලෙස ප්‍රකාශ කරන ලදී.

ගරු සභාපති එස්.බී කුමාරදාස මැතිතුමා තමන් මේ සඳහා විශේෂ අවධානයක් යොමු කර අදාල කාර්ය ඉටු කර දීමට කටයුතු කරන බව සඳහන් කරන ලදී.

ගරු මන්ත්‍රී ඩී.පී බන්දුලසේන මැතතුමා අලි මිනිස් ගැටළුවට විසඳුමක් ලෙස මෙම ක්‍රියාත්මක කරන අහල් කැපීමේ වැඩපිළිවෙල සාර්ථක වැඩ පිළිවෙලක් නොවන බවත්, වන ජීවී දෙපාර්තමේන්තුව පවා මේ සම්බන්ධයෙන් දැනුවත් නමුත් අහල කැපීම අඛණ්ඩව සිදු කරගෙන යන බවත්, මෙහිදී කළු ගලක් හමු වුවහොත් ඒ සඳහා කුමක් කරනවාද යන්න සොයා බැලිය යුතු බවත්, එසේ කළු ගල් ඉවත් නොකරන්නේ නම් අහල කැපීමේ අරමුණ ඉටු නොවන බව කරුණු දක්වමින් සඳහන් කරන ලදී.

තවද මෙම පස් ප්‍රවාහනය හේතුවෙන් ආලංකුලම කාපට් මාර්ගය විනාශ වී පවතින බවත්, එහි පවතින පාලම මේ වන විට පුපුරා ඇති බවත්, මේ සම්බන්ධයෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අවධානය යොමු කල යුතු වුවත්, ඒ සම්බන්ධයෙන් අධීක්ෂණයක් සිදු කර නැති බවත්, නමුත් ප්‍රදේශිය සභා පනතේ පවතින බලය යටතේ ස්වාභාවික ජලය ගලා යෑම අවහිර වන අයට විරුද්ධව කටයුතු කල හැකි වන බැවින් ඒ සම්බන්ධයෙන් අප අවධානය යොමු කල යුතු බවත්, නුවර වැව ගොඩ කිරීම සම්බන්ධයෙන් පවතින ගැටළුවටද මෙම පනතේ පවතින වගන්ති වල බලය පාවිච්චි කල හැකි බවත්. එය අපගේ වගකීමක් වන බවත්, සඳහන් කරන ලදී.

ගරු සභාපති එස්. බී කුමාරදාස මැතිතුමා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය උදෙසා තීන්දු තීරණ ගැනීම වෙනුවෙන් ගෞරවයෙන් සහයෝගය දැක්වූ ගරු මන්ත්‍රීතුමන්ලා වෙත හා ගරු මන්ත්‍රීතුමියන්ලා වෙත ස්තූතිය ප්‍රකාශ කරමින් 2022.03.22 වන දින පැවැත්වූ මහ සභා රැස්වීම ප.ව 11.35 ට අවසන් කරන ලද අතර එළඹෙන මහ සභාව 2022.04.22 වන දින පෙ.ව 10.00 පැවැත්වෙන බව සඳහන් කරන ලදී.

| | |
|---|---|
| ................................... | ........................................ |
| බී. එච් ප්‍රදීප් නිශාන්ත, | එස්. බී කුමාරදාස, |
| ලේකම්, | සභාපති , |
| නැ. නු. ප ප්‍රාදේශීය සභාව, | නැ. නු. ප්‍රාදේශීය සභාව, |
| විජයපුර. | විජයපුර. |